කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023

අප්‍රේල් - 2025

BMGT E 2055 - ව්‍යාපාර තොරතුරු පද්ධති

කාලය: පැය 03 යි

උපදෙස්

- ලබා දී ඇති උපදෙස් සහ ප්‍රශ්න ඉතා හොඳින් කියවන්න.
- කාලය: පැය 3 යි
- සම්පූර්ණ ලකුණු: 100 (I කොටස - ලකුණු 60, II කොටස - 40)
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සපයන අවස්ථාවේ දී මෙකී ද්‍රව්‍ය විභාග ශාලාව තුළ භාවිතා කිරීම තහනම් ය: ජංගම දුරකථන / ස්මාර්ට්ෆෝන් / ස්මාර්ට් ඔරලෝසු / වෙනත් ඉලෙක්ට්‍රොනික හෝ සන්නිවේදන උපකරණ.
- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකට බෙදා ඇත: I කොටස සහ II කොටස.**

I කොටස (ලකුණු 60)

1 . I වන කොටසෙහි ඇති සියලුම ප්‍රශ්නවලට ප්‍රශ්න පත්‍රය මතම පිළිතුරු සපයන්න.

2. ප්‍රශ්නයට පිළිතුරු ලබා දුන්නත්, නැතත් I වන කොටසෙන් කිසිම පිටුවක් ඉවත් නොකරන්න.

II කොටස (ලකුණු 40)

1. II කොටස පිළිතුරු ලිවීම සඳහා ලබා දී ඇති පිළිතුරු පොත් පිංච සහ අතිරේක කොළ භාවිතා කරන්න.

2. ලබා දී ඇති ප්‍රශ්න තුනෙන්: දෙකක් පමණක් උත්සාහ කරන්න.

3. සෑම මූලික ප්‍රශ්නයකටම ලකුණු 20 ක් ලබා දෙන අතර, දෙවන කොටස සඳහා මුළු ලකුණු 40 ක් ඇත.

4. ඔබේ පිළිතුරු පැහැදිලිව ලිවිය යුතු අතර සෑම මූලික ප්‍රශ්නයකම පිළිතුරු සැපයීම නව පිටුවකින් ආරම්භ කළ යුතුය.

I කොටස - මෙම ප්‍රශ්න පත්‍රය මත එක් එක් ප්‍රශ්නය කෙලින් පිළිතුර/පිළිතුරු සලකුණු කරන්න. II කොටස සඳහා ලබා දී ඇති පොත් පිංචේ පිළිතුරු ලිවීමෙන් වලකින්න.

පහත දැක්වෙන සෑම ප්‍රකාශයක්ම හොඳින් කියවා ඒවා සත්‍යද එසේනම් (T) ද, අසත්‍ය නම් (F)ද, පිළිතුරේ නිරවද්‍යභාවය සම්බන්ධව විශ්වාසයක් නොමැති නම් (NS) ද යනුවෙන් සලකුණු කරන්න.

1 . ව්‍යාපාරයක උපායමාර්ගික සාර්ථකත්වය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ එය භාවිතා කරන මෘදුකාංග පද්ධති මතය [දෘඩාංග, දත්ත කළමනාකරණය හෝ ජාල යටිතල පහසුකම් වලින් සැලකිය යුතු බලපෑමක් නොමැත].

(T / F / NS)

2. වෙළඳ දැන්වීම් ආදායම් ආකෘතිය (Advertising Revenue Model) ප්‍රධාන වශයෙන් නිෂ්පාදන හෝ සේවා මිලදී ගැනීම සඳහා පරිශීලකයින්ගෙන් සෘජුවම අය කිරීමෙන් ආදායමක් උපයයි.

(T / F / NS)

3. ගනුදෙනු ගාස්තු ආදායම් ආකෘතිය (Transaction Fee Revenue model) මඟින් ස්වාධීන පාර්ශවයන් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමෙන් සහ අය කිරීමෙන් සමාගමකට ආදායමක් උපයා ගැනීමට හැකියාව ලබා දේ.

(T / F / NS)

4. හැඳුනුම් කළමනාකරණ පද්ධති(Identity Management Systems) පරිශීලක අනන්‍යතා සහ ප්‍රවේශ පාලන කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, දෘඩාංග හෝ සන්නිවේදන ජාල සමඟ සම්බන්ධ නොවේ.

(T / F / NS)

5. පද්ධති අවදානම් බාහිර සයිබර් තර්ජන වලින් පමණක් පැන නගින අතර, වැරදි ලෙස සැකසුම් සකස් කිරීම් හෝ මෘදුකාංග දෝෂ වැනි අභ්‍යන්තර දෝෂ දායක නොවේ.

(T / F / NS)

6. සැපයුම් දාම කළමනාකරණය (SCM) භාණ්ඩ ප්‍රවාහනයේ සැපයුම් සමඟ පමණක් කටයුතු කරන අතර තොරතුරු සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය බැහැර කරයි.

(T / F / NS)

7. ගනුදෙනු සැකසුම් පද්ධතියක් (TPS) සංවිධානයක මෙහෙයුම් මට්ටමින් එදිනෙදා මෙහෙයුම් සහ සාමාන්‍ය ගනුදෙනු හැසිරවීමට සහාය වේ.

(T / F / NS)

8. තොරතුරු පද්ධති ආරක්ෂාව, අභ්‍යන්තර ආයතනික තර්ජන සමඟ පමණක් කටයුතු කරන අතර බාහිර අවදානම් හෝ අනුකූලතා ආශ්‍රිත ගැටළු ආමන්ත්‍රණය නොකරයි.
(T / F / NS)

9. සවිස්තර/ප්‍රකාශිත (Explicit) දැනුම යනු අත්පොත් සහ දත්ත සමුදායන් වැනි විධිමත් ලේඛන හරහා පැහැදිලිව ප්‍රකාශ කළ හැකි, කේතනය කළ හැකි සහ බෙදා ගත හැකි දැනුමයි.
(T / F / NS)

10. බුද්ධිමය දේපළ ආරක්ෂාව ඩිජිටල් අන්තර්ගතයන් සහ මෘදුකාංග සඳහා අදාළ නොවේ, මන්ද එවැනි වත්කම් පහසුවෙන් අනුකරණය කළ හැකි නිසා.
(T / F / NS)

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 1 බැගින් = මුළු ලකුණු 10)

<u>දී ඇති විකල්ප හතර අතරින් වඩාත්ම සුදුසු පිළිතුර යටින් ඉරක් අඳින්න</u>.

01. තොරතුරු පද්ධති පිළිබඳ සමාජ තාක්ෂණික පද්ධති දෘෂ්ටිකෝණයට අනුව, පහත සඳහන් ඒවායින් වඩාත් නිවැරදි කුමක්ද?

අ) පුද්ගලයින් හෝ ක්‍රියාවලීන් වෙනස් නොකර වුවද ,නවතම තාක්ෂණය භාවිතා කරන විට තොරතුරු පද්ධති වඩාත් හොඳින් ක්‍රියාත්මක වේ,.

ආ) සේවක කාර්ය සාධනය වැඩි කිරීමට තාක්ෂණය වැඩිදියුණු කිරීම පමණක් ප්‍රමාණවත් වේ.

ඇ) තොරතුරු පද්ධතියක් සාර්ථක කර ගැනීමට ව්‍යාපාර නීති සහ ක්‍රියා පටිපාටි ප්‍රමාණවත් වේ.

ඈ) හොඳ තොරතුරු පද්ධතියකට තාක්ෂණය සහ සංවිධානය යන දෙකම හොඳින් එකට වැඩ කිරීමට අවශ්‍ය වේ.

02. ව්‍යාපාර ක්‍රියාවලීන්හි තොරතුරු පද්ධති භාවිතා කිරීමේ සාමාන්‍ය ප්‍රතිලාභයක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

අ) දත්ත මත පදනම් වූ තීරණ ගැනීම වැඩි දියුණු කිරීම

ආ) මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

ඇ) තොරතුරු ප්‍රවාහයේ නිරවද්‍යතාවය සහ වේගය වැඩි කිරීම

ඈ) ඕනෑම ව්‍යාපාරික ක්‍රියාකාරකමකට සේවක සහභාගීත්වයේ අවශ්‍යතාවය ප්‍රතිස්ථාපනය කිරීම

03. සැපයුම් දාම කළමනාකරණ (SCM) පද්ධතිවල ප්‍රාථමික පරිශීලකයින් කවුද?

අ) විකුණුම්, අලෙවිකරණය, පාරිභෝගික සේවය

ආ) ගිණුම්කරණය, මූල්‍ය, සැපයුම් සහ නිෂ්පාදනය

ඇ) ගනුදෙනුකරුවන්, නැවත විකුණුම්කරුවන්, හවුල්කරුවන්, සැපයුම්කරුවන් සහ බෙදාහරින්නන්

ඈ) ඉහත සියල්ල

04. ජාලයක ගිනි ආවරණයක [firewall] ප්‍රධාන ඉලක්කය කුමක්ද?

අ) ජාලයට අනවසර ප්‍රවේශය වැළැක්වීම

ආ) ජාලය හරහා සම්ප්‍රේෂණය වන දත්ත සංකේතනය කිරීමට.

ඇ) ජාල කාර්ය සාධනය ප්‍රශස්ත කිරීමට

ඈ) ජාලයෙන් අනිෂ්ට මෘදුකාංග හඳුනාගෙන ඉවත් කිරීමට

05. ප්‍රති-වයිරස මෘදුකාංගයක (Antivirus Software) ප්‍රධාන අරමුණ කුමක්ද?

අ) තතුබෑම් ප්‍රහාර (Phishing Attacks) වලින් ආරක්ෂා වීමට

ආ) පරිගණකයකින් අනිෂ්ට මෘදුකාංග හඳුනාගෙන ඉවත් කිරීමට

ඇ) රැහැන් රහිත (Wireless) ජාල සුරක්ෂිත කිරීම සඳහා

ඈ) සංවේදී ලිපිගොනු සංකේතනය (encrypt) කිරීමට.

6. පාරිභෝගික සබඳතා කළමනාකරණය (CRM) පාරිභෝගිකයන් රඳවා තබා ගැනීම වැඩිදියුණු කරන්නේ කෙසේද?

අ) පාරිභෝගික ප්‍රතිපෝෂණ සහ පැමිණිලි නොසලකා හැරීමෙන්.

ආ) නව පාරිභෝගිකයින්ට පමණක් වට්ටම් ලබා දීමෙන්.

ඇ) පුද්ගලාරෝපිත අත්දැකීම් සහ කාලීන සහය ලබා දීමෙන්.

ඈ) නව ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීම කෙරෙහි පමණක් අවධානය යොමු කිරීමෙන්.

7. සයිබර් ආරක්ෂණයේ සංකේතනය (Encryption in Cyber Security) කිරීමේ අරමුණ කුමක්ද?

අ) අනවසර ප්‍රවේශයකින් දත්ත ආරක්ෂා කිරීම.

ආ) ජාල වේගය වැඩි කිරීම.

ඇ) අනිෂ්ට වෙබ් අඩවි (Malicious Websites) අවහිර කිරීම.

ඈ) ජාල ගමනාගමනය අධීක්ෂණය කිරීම.

8. තොරතුරු පද්ධතිය හි පෞද්ගලිකත්වය සහ රහස්‍යභාවය අතර ඇති ප්‍රධාන වෙනස කුමක්ද?

අ) පෞද්ගලිකත්වය යනු පුද්ගලික දත්ත පාලනය කිරීමේ අයිතිය වන අතර, රහස්‍යභාවය යනු බලයලත් පාර්ශ්වයන්ට පමණක් දත්ත වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කිරීමයි.

ආ) පෞද්ගලිකත්වය යනු නීතිමය යෙදුමකි; රහස්‍යභාවය යනු සදාචාරාත්මක යෙදුමකි.

ඇ) රහස්‍යභාවය බලයලත් පරිශීලකයින්ට ප්‍රවේශ වීම සීමා කරයි; රහස්‍යභාවය යනු පුද්ගලයෙකුගේ දත්ත පාලනයට ඇති හැකියාවයි.

ඈ) පෞද්ගලිකත්වය යනු ආයතනික දත්ත ගැන ය; රහස්‍යභාවය යනු පුද්ගලික දත්ත ගැන ය.

9. ව්‍යාපාර තොරතුරු පද්ධතියේ වලාකුළු පරිගණකකරණය (Cloud computing) යනු,

අ) සාමාන්‍යයෙන් මිනිස් බුද්ධිය අවශ්‍ය වන කාර්යයන් ඉටු කරනා පරිගණක වේ.

ආ) කෘතිම ත්‍රිමාණ (3D) අතථ්‍ය පරිසරයක් සමඟ අන්තර් ක්‍රියා කිරීම වේ.

ඇ) පද්ධති ඩිජිටල් ප්‍රහාර වලින් ආරක්ෂා කිරීම වේ.

ඈ) අන්තර්ජාලය හරහා පරිගණක සම්පත් වෙත ඉල්ලුම මත ප්‍රවේශය ලබා දීම වේ.

10. අප්‍රකාශිත (tacit) දැනුමේ ප්‍රධාන ලක්ෂණය කුමක්ද?

අ) එය අතිශයින්ම පුද්ගලාරෝපිත සහ සන්දර්භයට විශේෂිත ය.

ආ) එය දත්ත සමුදායන් තුළ පමණක් ගබඩා කර ඇත.

ඇ) එය පහසුවෙන් අත්පොත්වල ලේඛනගත කළ හැකිය.

ඈ) එය සම්ප්‍රේෂණය කිරීමට මිනිස් අන්තර්ක්‍රියා අවශ්‍ය නොවේ.

11. මෘදුකාංග වල බුද්ධිමය දේපළ ආරක්ෂා කරන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

අ) වෙළඳ ලකුණු (Trademarks)

ආ) ව්‍යාජ කේතය (Pseudocode)

ඇ) ප්‍රකාශන හිමිකම (Copyright)

ඈ) IMEI අංකය

12. ඩිජිටල් භාණ්ඩවල ප්‍රධාන ලක්ෂණයක් වඩාත් හොඳින් පිළිබිඹු කරන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

 අ) ඒවාට භෞතික ප්‍රවාහනය සහ ගබඩා කිරීම අවශ්‍ය වේ.

ආ) ඒවා සාම්ප්‍රදායික වෙළඳපොළවල් හරහා පමණක් විකුණනු ලැබේ.

ඇ) ඒවා පරිමාණය කළ හැකි අතර භෞතික සැපයුම් නොමැතිව බෙදා හරිනු ලැබේ.

ඈ) ඒවා එක් වරකට වඩා භාවිතා කළ නොහැක.

13. ඊ-වාණිජ්‍යයේ විකුණුම් ආදායම් ආකෘතිය වඩාත් හොඳින් නියෝජනය කරන්නේ කුමක්ද?

අ) බැනර් දැන්වීම් හරහා ආදායමක් උපයන බ්ලොග් අඩවියක්

ආ) පාරිභෝගිකයින්ට සෘජුවම භෞතික හෝ ඩිජිටල් නිෂ්පාදන අලෙවි කරන මාර්ගගත වෙළඳසැලක්

ඇ) ගෙවන ලද, උත්ශ්‍රේණි (upgraded) කිරීම් සහිත නොමිල ජංගම යෙදුමක්

ඈ) යොමු සබැඳි වලින් උපයන වෙබ් අඩවියක්

14. පහත සඳහන් ඊ-වාණිජ්‍ය වේදිකාවලින් අනුබද්ධ ආදායම් ආකෘතිය බොහෝ විට භාවිතා කරන්නේ කුමක්ද?

අ) නොමිලේ සහ වාරික සැලසුම් දෙකම පිරිනමන Spotify

ආ) බ්ලොග්කරුවන් තම නිෂ්පාදන ප්‍රවර්ධනය කර විකුණුම් ජනනය කරන විට එමගින් යම් ප්‍රතිශතයක් උපයන Amazon

ඇ) මාසික දායකත්වයක් අය කරන Netflix

ඈ) විකුණන ලද අයිතමයකට ගාස්තුවක් අය කරන Etsy

15. සමාගම්, පද්ධති වෙත අනවසරයෙන් ප්‍රවේශ වීම වැළැක්වීම සඳහා පහත සඳහන් භාවිතයන්ගෙන් වඩාත් ඵලදායී වන්නේ කුමක්ද?

අ) පහසුව සඳහා කණ්ඩායම් සාමාජිකයින් අතර මුරපද බෙදා ගැනීම

ආ) ශක්තිමත්, අනන්‍ය මුරපද භාවිතා කිරීම සහ ද්වි-සාධක සත්‍යාපනය (two-facter authentication) සක්‍රිය කිරීම

ඇ) වැඩපොළ අසල ඇලෙන සුළු සටහන් (sticky notes) භාවිතයෙන් පිවිසුම් විස්තර ලිවීම

ඈ) අනුකූලතා ගැටළු වළක්වා ගැනීම සඳහා මෘදුකාංග යාවත්කාලීන කිරීම් අක්‍රීය කිරීම

(මුළු ලකුණු 30)

ප්‍රශ්න පත්‍රයේ වෙන් කර ඇති ඉඩෙහි පමණක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු පොත භාවිතා නොකරන්න.

01. තොරතුරු පද්ධතියක් සංවිධානයක් තුළ තීරණ ගැනීම සහ සම්බන්ධීකරණය සඳහා සහාය වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. තොරතුරු පද්ධති සඳහා වන තාක්ෂණික සහ හැසිරීම් ප්‍රවේශයන් සංසන්දනය කරන්න.

තාක්ෂණික ප්‍රවේශය (Technical approach)	හැසිරීම් ප්‍රවේශය (Behavioral approach)

03. පුළුල් සැපයුම් දාම කළමනාකරණ පද්ධති විවිධ සැපයුම් දාම ක්‍රියාවලීන් කළමනාකරණය සඳහා සමාගම්වලට උපකාරී වන බවට ඔබ එකඟ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

04. පාරිභෝගික ජීවිත කාල අගය (CLV) යනු කුමක්ද? ඉතා කෙටියෙන් පැහැදිලි කරන්න.

05. විකුණුම් කණ්ඩායමක් සඳහා විශේෂයෙන් පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය (CRM) වැදගත් වන්නේ ඇයි? ඉතා කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ඩිජිටල් අලෙවිකරණ උපාය මාර්ග ව්‍යාපාරවලට මාර්ගගත පරිසරය තුළ ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීමට උපකාරී වන ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

07. විද්‍යුත් වාණිජ්‍යයේ ප්‍රධාන ආකාර තුන (03) ලැයිස්තුගත කර එක් එක් සඳහා සුදුසු උදාහරණයක් ලබා දෙන්න.

08. පහත සඳහන් දැනුම් වර්ග සඳහා ලක්ෂණ දෙකක් (02) බැගින් සඳහන් කරන්න.

අප්‍රකාශිත **(Tacit)** දැනුම	ප්‍රකාශිත **(Explicit)** දැනුම

09. CIA ත්‍රිත්වයේ ආරක්ෂක මූලධර්ම දෙකක් නම් කරන්න.

10. කළමනාකරණ තොරතුරු පද්ධතියේ (MIS) කාර්යභාරය කුමක්ද, කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02 * 10 = ලකුණු 20)

(මුළු ලකුණු 60)

II කොටස: මෙම කොටස සඳහා ඔබේ පිළිතුරු ලිවීමට ලබා දී ඇති පිළිතුරු පොත භාවිතා කරන්න. ලබා දී ඇති ප්‍රශ්න තුනෙන් ප්‍රශ්න දෙකකට (02) පමණක් පිළිතුරු දෙන්න.

ප්‍රශ්න අංක **01**

අ) ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය (ERP) නිර්වචනය කර එය දෙපාර්තමේන්තු හරහා මූලික ව්‍යාපාරික ක්‍රියාවලීන් ඒකාබද්ධ කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න?

(ලකුණු 04)

ආ) පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ පද්ධති (CRM) සහ සැපයුම් දාම කළමනාකරණ පද්ධති (SCM) ඒවායේ මූලික අරමුණු, පරිශීලකයින් සහ දත්ත ප්‍රවාහයන් අතර සංසන්දනය කිරීමෙන් වෙනස හඳුනා ගන්න.

(ලකුණු 08)

ඇ) "තොරතුරු පද්ධති මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරයි, සේවක අත්දැකීම් සහ තීරණ ගැනීමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කරයි". මෙම ප්‍රකාශය සැබෑ ලෝකයේ උදාහරණ දෙකක් භාවිතා කරමින් විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක **02**

අ) උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තොරතුරු පද්ධති අත්‍යවශ්‍ය මෙවලම් වේ.
තරඟකාරී වාසි ලබා ගැනීමට සහ ප්‍රධාන උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු හය (06) ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමට සංවිධානවලට තොරතුරු පද්ධති භාවිතා කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න?

(ලකුණු 10)

ආ) සුදුසු උදාහරණ යොදා ගනිමින් විද්‍යුත් වාණිජ්‍යයේ අනන්‍ය ලක්ෂණ හතරක් (04) පැහැදිලි කිරීමෙන් විද්‍යුත් වාණිජ්‍යය සාම්ප්‍රදායික වාණිජ්‍යයෙන් වෙනස් වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 03

ඇ) සංවිධාන විසින් පොදුවේ මුහුණ දෙන ප්‍රධාන සයිබර් ආරක්ෂණ ගැටළු පහක් (05) හඳුනාගෙන පැහැදිලි කරන්න. සැබෑ ලෝකයේ උදාහරණ සමඟ එක් එක් ගැටළුව විමසා මෙම අභියෝග අවම කිරීම හෝ ජය ගැනීම සඳහා සංවිධානවලට අනුගමනය කළ හැකි ඵලදායී උපාය මාර්ග සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ) තොරතුරු සමාජ සන්දර්භය තුළ, තොරතුරු පද්ධති සහ තාක්ෂණය භාවිතා කිරීම හා සම්බන්ධ දේශපාලන, සමාජීය සහ සදාචාරාත්මක ගැටළු වළක්වා ගැනීම සඳහා පුද්ගලයන්ට සහ සංවිධානවලට ගත හැකි සුදුසු ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)